# කුරුණෑගල ප්‍රාදේශීය සභාව
# කුරුණෑගල දිස්ත්‍රික්කය

---------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 දෙසැම්බර් 05 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ලේඛන අනුව රු.232,264 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට අනුව එය රු.449,729 ක් වීම හේතුවෙන් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ණයහිමියෝ රු.217,465 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් රථ හා කරත්ත වටිනාකම වූ රු.19,432,945 තුල 2012 වර්ෂයේ ඉවත් කල රු.102,000 ක් වටිනා ජල බවුසරයක අගයද, දැනට සභාවේ නොමැති රු.347,145 ක් වටිනා කසල කරත්ත අගයද ඇතුලත්ව තිබුණි.

(ඇ). භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් වටිනාකම රු.5,935,229 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.6,346,457 ක් වූයෙන් පුස්තකාල පොත් ශේෂය රු.411,228 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.90,353 ක උප පත්‍රිකා පොත් ශේෂය ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ). මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම් ලෙස දක්වා තිබූ රු.26,030,646 ක වටිනාකම තුල වෙනත් ආදායම් ලෙස ගිණුම් ගතවිය යුතු පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.600,000 ක කාර්ය සාධන තරඟ සඳහා ලැබීම්ද ඇතුලත්ව තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ රු.24,796,074 ක් වුවද, ගිණුම් වලට එය රු.25,430,646 ක් ලෙස රු.634,572 ක් වැඩියෙන් ගෙන තිබුණි.

(ඉ). ජ'නල් සටහන් අංක 15 මගින් විවිධ ණයහිමියෝ (කර්මාන්ත) ගිණුම හා ප්‍රාග්ධන වැය ගිණුම රු.44,932,404 ක් පිළිවෙලින් හර හා බැර ලෙස දක්වා තිබුණද, ලෙජරයේ විවිධ ණයහිමියෝ කර්මාන්ත ගිණුමට එකී අගය රු.44,301,195 ක් ලෙස රු.631,209 ක් අඩුවෙන් ගෙන තිබුණි.

(ඊ). 2013 සැප්තැම්බර් 03 දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සියයට 10.5 ක පොලී ප්‍රතිශතයක් මත ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කල රු.3,000,000 ක මුදල සඳහා සමාලෝචිත වර්ෂයට අදාල රු.105,000 ක පොලී මුදල පොලී ආදායම් යටතේ හා ආදායම් ණයගැතියන් යටතට ගෙන නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂයට අදාලව මුද්දර ගාස්තු බිල්කර ගිණුම් ගතකර නොතිබූ අතර, 2009 වර්ෂය වෙනුවෙන් ලද රු.11,619,727 ක්ද, 2011 වර්ෂය වෙනුවෙන් ලද රු.29,700,107 ක්ද, ලෙසට එකතුව රු.41,319,834 ක් සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම 2010 වර්ෂයට අදාල රු.1,601,524 ක්ද, 2011 වර්ෂයට අදාල රු.22,500,000 ක්ද හා 2012 වර්ෂයට අදාල රු.8,398,476 ක්ද ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට උපචිතව පැවති එකතුව රු.32,500,000 ක මුද්දර ගාස්තු ආදායම ණය ගැතියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඌ). සමාලෝචිත වර්ෂය තුල ඉඩම් වැඩිදියුණු කිරීම් හා ගොඩනැගිලි වැය විෂයය (අංක - 309) යටතේ රු.2,466,295 ක් වැයකර මරළුවාව උපකාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම හා වැටක් ඉදිකිරීම සිදුකර තිබූ අතර, එකී වියදම් ප්‍රාග්ධන ගතකර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයට අදාලව වරෙන්තු ගාස්තු හා දඩ ලෙස ගිණුම් ගතකර තිබූ රු.4,477,749 ක වටිනාකම තුල ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ උසාවි දඩ රු.817,421 ක ප්‍රමාණයක්ද ඇතුලත්ව තිබුණි.

(එ). සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණයහිමියෝ රු.1,434,136 ක ශේෂයක් ගිණුම්ගතවී නොතිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.5,566,647 ක්ව තිබුණි.

1.3.3 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 11 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 101,526,159 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.127,835,918 ක් වූ අතර, ඒයින් රු. 12,973,327 කට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවුණි.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.94,455,834 ක් වූ අතර, ඒයින් රු. 2,949,830 ක් වසර 1කට වඩා පැරණි ශේෂයන් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 94,903,911 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.25,825,051 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,896,724 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,928,327 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.45,988,085 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.69,730,327 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.2,082,809 ක් දක්වා අඩුවී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.115,183,526 න් සියයට 83 ක් ලෙස රු.95,250,153 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.45,988,085 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.89,358,474 න් සියයට 38 ක් ලෙස රු.34,059,141 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර ඉන් සියයට 76 ක් ලෙස රු.26,030,646 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.69,730,326 න් සියයට 30 ක් ලෙස රු.20,768,941 ක් පමණක් සභා අරමුදල් වැය වී තිබූ අතර ඉතිරිය සියයට 70 ක් වූ රු.48,961,385 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන්ගෙන් සමන්විත විය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

වෙළඳ බලපත්‍ර, ව්‍යාපාර බදු, කඩකුලී, බදුකුලී වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම සඳහා නිශ්චිත බලයක් නොතිබුණද, සභාවේ ආදායම් එකතු කරන්නන් විසින් වර්ෂය පුරාම වරිපනම් හා වෙළඳ බලපත්‍ර වැනි ආදායම්ද ක්ෂේත්‍රයේදී එකතු කර තිබුණි.

2.3.2 වරිපනම් බදු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාල බල ප්‍රාද්ශයේ වරිපනම් බදු හිඟය රු.1,519,431 ක් වූ අතර, වාර්ෂික බිල් කිරීම රු.2,470,365 ක් වූයෙන් වරිපනම් හිඟය බිල් කිරීම මත සියයට 61 ක් පමණ විය. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 - 159 වගන්ති හා ප්‍රාදේශීය සභා රීති මාලාවේ රීති 33 - 42 පරිදි ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ තෙවන කාර්තුව දක්වා හිඟ ලැයිස්තු පිළියෙල කර තිබුණද, අවසන් නිවේදන නිකුත් කර දේපල තහනම් කිරීමේ ක්‍රියාවලිය සිදුකර නොතිබුණි

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට වැල්ලව උප කාර්යාල බල ප්‍රදේශයට අදාලව වරිපනම් බදු හිඟ ශේෂය රු.3,320,612 ක් වූ අතර, වර්ෂයට අදාල බිල් කිරීම රු.3,209,318 ක් වූයෙන් වරිපනම් බදු හිඟය බිල් කිරීම් මත සියයට 103 ක් පමණ විය.

2.3.3 ඉඩම් විකුණුම් මත බදු

ඉඩම් කට්ටි සැලසුම් අනුමත කිරීම මත සභාවට ලැබිය යුතු සියයට 1 බදු මුදලින් අනුමත කල කට්ටි සැලසුම් 6 කට අදාලව රු.598,460 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලැබී නොතිබුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.544,331 ක් විය.

2.3.5 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වටිනාකම රු.95,000 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධන ඇගයීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභා බල ප්‍රදේශයේ සවිකර ඇති වීථි පහන් සංඛ්‍යාව 2250 ක් වූ අතර, එකී වීථි පහන් නඩත්තුව සඳහා සමාලෝචිත වර්ෂය තුල රු.2,947,875 ක් වැයකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල ඇස්තමේන්තු ගත පිරිවැය රු.5,500,000 ක් යටතේ ඉටුකිරීමට සැලසුම් කර තිබූ සභා කර්මාන්ත 06 ක් ඉටුකර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුල සභා දේශපාලන අධිකාරිය හා සභා කාර්ය මණ්ඩලය විදේශ සංචාර 02 ක නිරතවී තිබුණු අතර, ඒ වෙනුවෙන් රු.4,345,969 ක වැයක් සභා අරමුදලින් දරා තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ). සභාව විසින් 2008 - 2010 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 1103 ක් තිබුණද, අනුකූලතා සහතික 84 ක් පමණක් ලබාදී තිබුණි. අයදුම්පත්‍ර 1019 සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හෝ ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණි නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.254,750 ක ගොඩනැගිලි අනුකූලතා සහතික පත් ආදායමක්ද අදාල ගොඩනැගිලි ඉදිකිරීම අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය වාර්ෂිකව දීර්ඝ කරවා ගැනීමේ ගාස්තු ලෙස රු.395,000 ක ආදායමක්ද සභාවට උපයාගත හැකිව තිබුණි.

(ආ). වැල්ලව පොදු වෙළඳපල ලෙස භාවිතා කල ගොඩනැගිල්ල සභාව විසින් වැල්ලව පොලිසිය පවත්වා ගෙන යාම සඳහා මාසිකව රු.1,775 ක කුලියකට වසර ගණනාවක සිට ලබාදී තිබූ අතර, ඊට අදාල ගිවිසුම් අඩංගු ගොනුවක් සභාව සතුව නොතිබුණි. වර්තමානය වන විට වැල්ලව පොලිසිය විසින් අදාල ඉඩම පවරා ගැනීමට කටයුතු කරමින් පැවති අතර, සභාවට ඉඩමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලිපි ලේඛන නොමැතිවීම හේතුවෙන් අදාල ඉඩම අහිමිවීමේ අවදානමකට ලක්ව තිබුණි.

## 4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

### 4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අයවැය ලේඛනය අනුව වෙනත් ආදායම් හැර රු.133,205,094 ක ආදායමක් ඇස්තමේන්තු ගතකර තිබුණද, එයින් ලහාවී තිබුණේ සියයට 35 ලෙස රු.46,034,668 ක් පමණි. එමෙන්ම ප්‍රාග්ධන ආදායම් යටතේ රු.80,000,000 ක් ඇස්තමේන්තු ගත කලද ඉන් ලහාවී තිබුණේ සියයට 1 ක් ලෙස රු.941,701 ක් පමණි.

## 5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය